The National Chamber of Commerce of Sri Lanka

NEDA

# බස්නාහිර පළාත් වාවසායකත්ව සම්මාන 2026

## වාවසායකත්වයේ විශිෂ්ටයන් ඇගයීම



කර්මාන්ත / නිෂ්පාදන

කෘෂිකර්ම / පශු සම්පත් / ධීවර

සේවා
ආගන්තුක සත්කාර / සංචාරක / අනෙකුත් සේවා

ක්ෂුද්‍ර, කුඩා, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායන්

සංවිධානය
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය

## 01. සම්මාන උළෙල පිළිබඳ හැඳින්වීම

බස්නාහිර පළාත් ව්‍යවසායකයන් වෙනුවෙන් "ව්‍යවසායකත්ව සම්මාන 2026 - බස්නාහිර පළාත" සම්මාන ප්‍රදානෝත්සවය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) හා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) සහයෝගයෙන් යුතුව 9වන වරටත් සංවිධානය කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය දීර්ඝ කාලයක් තිස්සේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා දායකත්වය දක්වන ආයතනයකි. පුහුණු වැඩසටහන් / වැඩමුළු, මානව සම්පත් සංවර්ධනය, විද්‍යුත් වාණිජ වැඩසටහන් ආදී නිපුණතා සංවර්ධනය උදෙසා වූ වැඩසටහන් රාශියක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල නියුතු ව්‍යවසායකයින් සඳහා පවත්වනු ලබයි

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) හා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සහයෝගයෙන් යුතුව සංවිධානය කරනු ලබන මෙම සම්මාන ප්‍රදානෝත්සවයද බස්නාහිර පළාත් ක්ෂුද්‍ර, සුළු, මධ්‍යම හා විශාල පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් සිදු කරනු ලබන දිරිගැන්වීමේ වැඩසටහනක් හා තවත් එක් සේවාවක් ලෙස හැඳින්විය හැකිය.

මෙම සම්මාන ප්‍රදානෝත්සවය සඳහා විවිධ ව්‍යාපාර අංශ, ව්‍යාපාර පරිමාණයන් ආවරණය වන පරිදි සහ විශේෂිත නිර්ණායක 14ක් යටතේ ද සම්මාන පිරිනමනු ලැබේ. මෙවර ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සවය සඳහා අලුතින් එක් කරන ලද තවත් විශේෂ සම්මානයක් ලෙස සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමට දායක වන ආයතන/සංවිධාන ද ඇගයීමකට ලක් කෙරෙන අතර එහිදී ජයග්‍රාහකයින් ශූරතාවය, පලමු අනු ශූරතාවය සහ දෙවන අනු ශූරතාවය ලෙස සම්මානයට පාත්‍ර කරනු ලැබේ. බස්නාහිර පළාත් ව්‍යවසායකත්ව සම්මාන උළෙලේ සමස්ත ජයග්‍රාහකයින් ලෙස රන්, රිදී සහ ලෝකඩ සම්මාන ද ඇතුළුව, සම්මාන 50කට අධික ප්‍රමාණයක් ශූරතා, අනුශූරතා හා කුසලතා සහතික ද සමඟින් ජයග්‍රාහකයින් වෙත ප්‍රදානය කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

## 02. මෙම සම්මාන උළෙලෙහි අරමුණු

- බස්නාහිර පළාත තුළ ව්‍යවසායකයන් හඳුනාගැනීම හා ඔවුන් පිළිගැනීමට ලක් කිරීම
- බස්නාහිර පළාත සහ රටේ ආර්ථික සංවර්ධනය උදෙසා තම දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවසායකයින් දිරි ගැන්වීම හා උනන්දු කරවීම
- සිය ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ විශිෂ්ටත්වය ලබාගැනීමට ව්‍යවසායකයින් දිරිමත් කිරීම

## 03. සම්මාන ප්‍රදානය කරන ප්‍රධාන අංශ

- කර්මාන්ත / නිෂ්පාදන අංශය
- කෘෂිකර්මය / පශු සම්පත් සහ ධීවර අංශය
- සේවා අංශය (සත්කාරක සේවා/ සංචාරක/ වෙනත් සේවා)
- හොඳම ව්‍යවසායකයින් නගා සිටුවීමේ සංවිධානය/ ආයතනය සඳහා සම්මාන

## ඉහත ව්‍යාපාර අංශ වර්ගීකරණය

| කර්මාන්ත / නිෂ්පාදන අංශය | කෘෂිකර්මය | සේවා අංශය |
|---|---|---|
| ඇඟලුම් කර්මාන්තය | තේ වගාව | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සේවා |
| අත්යන්ත්‍ර රෙදිපිළි | රබර් වගාව | ආගන්තුක සත්කාර සේවා |
| අත්කම් නිෂ්පාදන සහ සෙල්ලම් බඩු | පොල් වගාව | සංචාරක සේවා |
| රබර් ආශ්‍රිත නිෂ්පාදන | කුළුබඩු ආශ්‍රිත වගාව | රූපලාවණ්‍ය සේවා |
| බෝට්ටු / යාත්‍රා නිෂ්පාදනය | සැකසූ ආහාර හා පාන වර්ග | ප්‍රවාහන හා සැපයුම් සේවා |
| මැණික් හා ස්වර්ණාභරණ | අත්‍යාවශ්‍ය තෙල් හා කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන | අධ්‍යාපන සේවා |
| සෙරමික් සහ වීදුරු නිෂ්පාදන | ඖෂධීය හා ආයුර්වේද ආශ්‍රිත නිෂ්පාදන | ඉදිකිරීම් සේවා |
| ගෘහ භාණ්ඩ / දැව නිෂ්පාදන | කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන | සෞඛ්‍ය සේවා |
| රසායනික හා තීන්ත නිෂ්පාදන | | වෙනත් සේවාවන් |
| පාවහන් / සම් නිෂ්පාදන | | |
| සැහැල්ලු ඉංජිනේරු කර්මාන්තය | | |
| ප්‍රවාහන හා මෝටර් රථ උපාංග | | |
| ඉලෙක්ට්‍රොනික හා විදුලි නිෂ්පාදන | | |
| ලිපිද්‍රව්‍ය හා කඩදාසි නිෂ්පාදන | | |
| ඇසුරුම්කරණ නිෂ්පාදන | | |
| ඖෂධ නිෂ්පාදන | | |
| වෙනත් නිෂ්පාදන කර්මාන්ත | | |

| පශු සම්පත් සහ ධීවර අංශය |
|---|
| මුහුදු ආහාර හා ජලජීවී වගා නිෂ්පාදන |
| විසිතුරු මසුන් |
| කිරි නිෂ්පාදන |
| කුකුළු පාලනය |
| වෙනත් මස් නිෂ්පාදන |
| පශු සම්පත් ආශ්‍රිත වෙනත් නිෂ්පාදන |

## 04. කර්මාන්තයේ පරිමාණය

| අංශය | ආර්ථික අංශය | පූර්ණ කාලීන සේවා නියුක්තිකයන් සංඛ්‍යාව | වාර්ෂික පිරිවැටුම - රුපියල් |
|---|---|---|---|
| ක්ෂුද්‍ර | කර්මාන්ත අංශය | 10 ට අඩු | මිලියන 20 ට අඩු |
| | සේවා අංශය | 05 ට අඩු | |
| සුළු | කර්මාන්ත අංශය | 10 – 50 දක්වා | මිලියන 21 - 350 දක්වා |
| | සේවා අංශය | 05 – 50 දක්වා | |
| මධ්‍යම | කර්මාන්ත අංශය | 51 – 200 දක්වා | මිලියන 351 - 1000 දක්වා |
| | සේවා අංශය | | |
| විශාල පරිමාණ | කර්මාන්ත අංශය | 201 ට වැඩි | මිලියන 1000 වැඩි |
| | සේවා අංශය | | |

## 05. ප්‍රදානය කරනු ලබන සම්මාන

- 2026 වසරේ බස්නාහිර පළාතේ හොඳම ව්‍යවසායකයා සම්මානය
  (රන්, රිදී, ලෝකඩ සම්මාන)

මෙය මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ වඩාත් වැදගත් මෙන්ම කීර්තිමත්ම සම්මානය යි. බස්නාහිර පළාත තුළ වඩාත්ම කැපී පෙනෙන විශිෂ්ඨතම ව්‍යවසායකයා මෙහිදී හඳුනාගනු ලබයි.

ඇගයීම සඳහා මූල්‍ය වර්ෂය ගණනය කරනුයේ

- මූල්‍ය වර්ෂය ජනවාරි මස 01 සිට දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන්නේ නම් 2024 වර්ෂය සඳහාද
- මූල්‍ය වර්ෂය අප්‍රේල් මස 01 සිට මාර්තු මස 31 දිනෙන් අවසන් වන්නේ නම් 2024-25 වර්ෂය සඳහාද වේ

- ව්‍යාපාර පරිමාණ සහ ව්‍යාපාර අංශ ඔස්සේ හොඳම ව්‍යවසායකයා සම්මාන (ශූරතාව, අනුශූරතාව සහ කුසලතා සහතික පත්‍ර ඇතුලුව සම්මාන 36කට අධික සංඛ්‍යාවක්)

මෙම සම්මාන ප්‍රදානෝත්සවයේ ව්‍යාපාර අංශ සඳහා පිරිනමන ප්‍රධාන සම්මාන ලෙස, ව්‍යාපාර පරිමාණ 04 යටතේ සම්මාන සඳහා වූ කර්මාන්ත/නිෂ්පාදන අංශය; කෘෂිකර්මාන්ත, පශු සම්පත් සහ ධීවර අංශය; සහ සේවා අංශය (සත්කාරක සේවා/ සංචාරක/ වෙනත් සේවා) යන අංශ සඳහා සම්මාන ප්‍රදානය කරනු ලැබේ.

| සම්මාන සංඛ්‍යාව | අංශය | සම්මානය |
|---|---|---|
| කර්මාන්ත / නිෂ්පාදන අංශය | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර අංශය | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| සේවා අංශය (සත්කාරක සේවා/ සංචාරක/ වෙනත් සේවා) | | |
| 01 | ක්ෂුද්‍ර | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | සුළු | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | මධ්‍යම | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| 01 | විශාල පරිමාණ | හොඳම ව්‍යවසායකයා සම්මානය |
| හොඳම ව්‍යවසායකයින් නගා සිටුවීමේ සංවිධානය/ ආයතනය | | |
| 01 | - | ප්‍රථම ස්ථානය |
| 01 | - | දෙවන ස්ථානය |
| 01 | - | තෙවන ස්ථානය |

## 06. විශේෂ සම්මාන (සම්මාන 14)

පහත සඳහන් විශේෂ නිර්ණායක / තේමා ක්ෂේත්‍ර යටතේ හොඳම කාර්ය සාධනය සඳහා සම්මාන 14 ක් පිරිනමනු ලැබේ

1. හොඳම පරිසර හිතකාමී ව්‍යවසායකයා සඳහා සම්මානය
2. හොඳම අපනයනකරු සඳහා සම්මානය - නිෂ්පාදන
3. හොඳම අපනයනකරු සඳහා සම්මානය - සේවා
4. හොඳම ඵලදායී ව්‍යවසායකයා සඳහා සම්මානය
5. හොඳම නව්‍ය ව්‍යවසායකයා සඳහා සම්මානය
6. හොඳම අගය එකතුකළ ව්‍යවසායකයා සඳහා සම්මානය
7. හොඳම බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුත් ව්‍යවසායකයා සඳහා සම්මානය
8. හොඳම තරුණ ව්‍යවසායකයා සඳහා සම්මානය (වයස අවු. 18ත් 35ත් අතර)
9. හොඳම කාන්තා ව්‍යවසායිකාව සඳහා සම්මානය
10. විශේෂ අවශ්‍යතාවලින් යුත් හොඳම ව්‍යවසායකයා සඳහා සම්මානය
11. කාන්තාවන් සඳහා වැඩිපුරම රැකියා අවස්ථා සපයන හොඳම ව්‍යවසායකයා
12. තිරසාර ව්‍යාපාරික භාවිතයන් සහිත ව්‍යාපාර ව්‍යවසාය සඳහා සම්මානය
13. මූල්‍ය කාර්ය සාධනය අතින් ශක්තිමත් හොඳම ව්‍යවසායකයා සඳහා වන සම්මානය
14. හොඳම ආනයන ආදේශක ව්‍යවසාය සඳහා සම්මාන

- මෙම වසරේ විශේෂයෙන් හඳුන්වා දෙනු ලබන සම්මානය

මේ සඳහා විශේෂිත වූ අයදුම් පත්‍රයක් ඇති අතර මෙහිදී ශූරතාවය, අනුශූරතාවය සහ සහතික පත්‍ර ඇතුලුව සම්මාන 3කට අධිකව පිරිනැමීමට නියමිතව ඇත.

1. **හොඳම ව්‍යවසායකයින් නගා සිටුවීමේ සංවිධානය/ ආයතනය සඳහා සම්මානය**

## 07. සම්මාන සඳහා සුදුසුකම්

මෙම සම්මාන සඳහා සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය

- අදාළ ව්‍යාපාරය බස්නාහිර පළාත තුළ පිහිටා තිබිය යුතුය. (ජාතික මට්ටමේ ව්‍යාපාර සංවිධානවල ශාඛාවක් නොවිය යුතුය)
- ක්ෂුද්‍ර, සුළු, මධ්‍යම හා විශාල පරිමාණ යන කර්මාන්ත අංශයන්ට අයත් ව්‍යාපාරයක් විය යුතුය.
- අයදුම් කරන අවස්ථාව වන විට අයදුම්කරුවන් සතුව වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් (BRC) තිබිය යුතුය.
- ව්‍යවසායකත්ව සංවර්ධනයට සහ නිපුණතා වර්ධනයට සහාය වන බැංකු, මූල්‍ය සමාගම්, රක්ෂණ ආයතන, පුහුණු සහ අරමුදල් සපයන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන (NGOs) ඇතුළු සංවිධාන සහ ආයතන ද මෙයට සුදුසුකම් ලබයි.

## 08. සම්මාන සඳහා තෝරාගැනීමේ ක්‍රමවේදය

සියලු අයදුම්පත් පැහැදිලිව සහ විනිවිද භාවයෙන් යුතු නිර්ණායක අනුව ඇගයීමට ලක් කරනු ලබන අතර, බහුවිධ විශේෂඥ දැනුම ඇති විනිශ්චය මණ්ඩලයක් විසින් සමාලෝචනය කරනු ඇත. ජයග්‍රාහකයින් පියවර 4ක් යටතේ නිර්ණය කිරීමට නියමිතව ඇත.

- අයදුම්පත්‍රවල සමාලෝචනය (Desk Review)
- විද්වත් මණ්ඩලයේ මූලික ඇගයීම සහ කෙටි ලැයිස්තුගත කිරීම
- සම්මුඛ පරීක්ෂණ
- ක්ෂේත්‍ර චාරිකා

## 09. තෝරාගැනීමේ නිර්ණායක (ලකුණු දීමේ පටිපාටිය)

| තෝරාගැනීමේ නිර්ණායකය | ලකුණු |
|---|---|
| නායකත්වය සහ උපාය මාර්ගය | 100 |
| නවීනත්වය / තාක්ෂණය | 80 |
| ගෝලීය සහ දේශීය වෙළඳපොළ කරා ළඟාවීම | 120 |
| වෙළඳපොළ කොටස / විකුණුම් කාර්යක්ෂමතාවය | 150 |
| රැකියා උත්පාදනය | 100 |
| ඵලදායිතාවය | 100 |
| ආයතනික සමාජ වගකීම් | 80 |
| බලශක්ති කාර්යක්ෂමතාවය සහ පරිසර හිතකාමීත්වය | 120 |
| මූල්‍ය කාර්ය සාධනය හා ව්‍යාපාර ඉලක්ක | 150 |
| එකතුව | 1000 |

## 10.හොඳම ව්‍යවසායකයින් නගා සිටුවීමේ සංවිධානය/ ආයතනය සඳහා සම්මාන තෝරාගැනීමේ නිර්ණායක (ලකුණු දීමේ පටිපාටිය)

| තෝරාගැනීමේ නිර්ණායකය | ලකුණු |
|---|---|
| සංවිධානය පිළිබඳ විස්තර (Organization Details) | 70 |
| ව්‍යවසායක සංවර්ධනය (Entrepreneur Development) | 100 |
| බලපෑම (Impact) | 150 |
| නවෝත්පාදනය (Innovation) | 100 |
| හවුල්කාරිත්වයන් (Partnerships) | 100 |
| ධාරිතා සංවර්ධනය (Capacity Building) | 100 |
| තිරසාරභාවය (Sustainability) | 100 |
| ජයග්‍රාහී අත්දැකීම් (Success Stories) | 180 |
| සම්මාන හා ඇගයීම් (Awards & Recognition) | 100 |
| මුළු ලකුණු | 1000 |

## 11. ඇගයීම් පටිපාටිය

අයදුම්පත් හොඳින් සමාලෝචනය කිරීමෙන් සහ ක්ෂේත්‍ර සත්‍යාපනයේ ප්‍රතිඵලවලින් පසුව සම්මානලාභීන්ගේ අවසාන තේරීම සිදු කරනු ලබන ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් විසින් අයදුම්පත ඇගයීමට ලක් කරනු ලැබේ.

විනිශ්චය මණ්ඩලය පහත සඳහන් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- බැංකු
- රාජ්‍ය ආයතන
- පුද්ගලික අංශය

## 12.ජයග්‍රාහකයන්හට හිමිවන විශේෂ ප්‍රතිලාභ

ජයග්‍රාහකයන්හට පහත ප්‍රතිලාභ හිමිවනු ඇත,

- පළාත් හා ජාතික මට්ටමේ ඇගයීමක්/පිළිගැනීමක්
- මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා පළාත් සහ ජාතික මට්ටමෙන් ප්‍රචාරයක්
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA), ජාතික වාණිජ මණ්ඩලය සහ අනෙකුත් ආයතන හරහා ලැබෙන පිළිගැනීම මත ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කරගැනීමට මෙන්ම ඉහළ ප්‍රචාරණයක් ලබා ගැනීමට අවස්ථාව

## 13. අයදුම්පත් භාරදීම

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් භාරදීමේ ගාස්තු ද සමග මහ ලේකම් / ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය, පළමු මහල, ජාතික වාණිජ මණ්ඩල ගොඩනැගිල්ල, නො. 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයට **2026 සැප්තැම්බර් මස 14 වන සඳුදා දින ප.ව. 4.00 ට පෙර** ගෙනවිත් භාරදිය යුතුය.

| අංශය | මුදල (රු.) |
|---|---|
| ක්ෂුද්‍ර | 2,000/- |
| සුළු | 4,000/- |
| මධ්‍යම | 10,000/- |
| විශාල පරිමාණ | 20,000/- |

අයදුම්පත් භාරදෙන අවස්ථාවේදී, භාරදීමේ ගාස්තු, මුදල් හෝ චෙක් පතක් මගින් ගෙවිය හැකිය. අවසාන අයදුම්පත ඉදිරිපත් කළ පසුව, කිසියම් හෝ හේතුවක් මත අයදුම්පත ඉල්ලා අස්කර ගන්නේනම්, අයදුම්පත භාරදීමේ ගාස්තුව ආපසු ලබා නොදෙන බවට කරුණාවෙන් සලකන්න.

චෙක්පත් " ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය" නමට ලිවිය යුතුය. අපගේ බැංකු ගිණුම් විස්තර පහත පරිදි වේ.

ගිණුමේ නම : ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
බැංකුව : ලංකා බැංකුව නගර ශාඛාව
බැංකු ගිණුම් අංකය : 350940

තැන්පතු පත්‍රිකාවේ/ මාර්ගගත හුවමාරු පත්‍රිකාවේ ස්කෑන් කළ පිටපත nishanthi@nationalchamber.lk; nethmi@nationalchamber.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවන්න.

## 14. සම්මාන ප්‍රදානෝත්සවය

"ව්‍යවසායකත්ව සම්මාන 2026 - බස්නාහිර පළාත" සම්මාන උළෙල **2026 දෙසැම්බර් මස 9 වන බදාදා දින BMICH හිදී** රාජ්‍ය ආයතන සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට නියමිතය.

## 14. විමසීම්

වැඩිදුර තොරතුරු සඳහා ජාතික වාණිජ මණ්ඩලය හා සම්බන්ධ වන්න :


නිශාන්ති දිල්රුක්ෂි
පරිපාලන නිලධාරී - වැඩසටහන් කළමනාකරණය
දූරකථන: 0114741788
දූරකථන: 076 2555707
nishanthi@nationalchamber.lk

හංසි ජයවර්ධන
විධායක නිලධාරී – වැඩසටහන් කළමනාකරණය
දූරකථන: 011 4741788
දූරකථන: 077 3678728
hansi@nationalchamber.lk

නෙත්මි සිල්වා
කනිෂ්ඨ විධායක නිලධාරී – වැඩසටහන් කළමනාකරණය
දූරකථන: 077 1672598
nethmi@nationalchamber.lk

# බස්නාහිර පළාත් ව්‍යවසායකත්ව සම්මාන 2025 - විශේෂ අවස්ථා













*Jointly Organized By*

The National Chamber of Commerce of Sri Lanka

NEDA

